## 'ප්‍රාථමික - ශිල්පීය' සේවා ගණය සඳහා දෛනික පදනම මත සේවකයින් ලියාපදිංචි කර ගැනීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පහත සඳහන් තනතුර සඳහා සේවා අවශ්‍යතාවය මත දෛනික පදනම මත ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- බර උපකරණ ක්‍රියාකරු - තනතුරු 01

ඒ අනුව පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම්** : දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබිබ හෝ 5 ශ්‍රේණිය (6වසර) සමත්ව තිබීම හා බර යන්ත්‍ර උපකරණ ක්‍රියා කිරීම පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

**ශිල්පීය නිපුණතා ප්‍රවීණතා** : බරවාහන ද ඇතුළුව පුරප්පාඩුව පවතින යන්ත්‍රෝපකරණ වර්ගය ක්‍රියා කරවීම හා පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබීම. මේ සඳහා 2009 අංක 08 දරණ මෝටර් රථ ප්‍රවාහන පනතේ 122 වගන්තියේ සඳහන් CE හෝ DE කාණ්ඩයේ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය නොවන අතර, J කාණ්ඩයේ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය වේ. තවද එකී පනතේ සඳහන් කරුණු හා ඒ සම්බන්ධව ඉදිරියේදී සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත් වනු ඇත.

**වෙනත් සුදුසුකම්** :

(1) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු අතර, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(2) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(3) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ වසර 05 ක අනුගාමී වසර 03 ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

(4) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (ස්ථිර තනතුරක සිටින අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**බඳවා ගැනීමේ ක්‍රමය** :

(1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

(2) රා.ප.ච. 10/2025 අනුව PL- 3 තනතුරට අදාළව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගැනිම

.

**අයදුම්පත් එවිය යුතු ආකාරය** : මෙ සමග සඳහන් කර ඇති අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කර සකස් කර ගත් අයදුම්පත් 2026 ඔක්තෝබර් මස 30 දිනට ප්‍රථම ලියාපදිංචි තැපැල මගින් හෝ සතියේ වැඩ කරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ ආයතන අංශයට භාර දී, භාර දුන් බවට කුවිතාන්සියක් ලබා ගන්නා ලෙසත්, ලිපි කවරයේ වම් පස ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

**අයදුම්පත සමග එවිය යුතු ලේඛන** : උප්පැන්න සහතිකයේ පිටපතක්/ ජාතික හැඳුණුම්පතෙහි පිටපතක්/ බර වාහන රියදුරු බලපත්‍රයේ පිටපතක්/අධ්‍යාපන සහතිකවල පිටපත්/පදිංචි සහතිකයේ පිටපතක්/ වෘත්තීය සුදුසුකම් හා වෙනත් සුදුසුකම්වල දැක්වෙන සහතිකවල පිටපත්

සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

රුවන් වික්‍රමආරච්චි,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

රුවන් වික්‍රමආරච්චි
සභාපති
ප්‍රාදේශීය සභාව
දික්වැල්ල

දිනය : 2026.10.08 දින.

CamScanner

## බර උපකරණ ක්‍රියාකරු තනතුර සඳහා ලියාපදිංචි කර ගැනීමේ අයදුම්පත්‍රය

01. සම්පූර්ණ නම : ........................................................................

02. මුලකුරු සමග නම : ........................................................................

03. ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද යන වග : ........................................................................

04. පුද්ගලික ලිපිනය : ........................................................................

05. දුරකතන අංකය : ........................................................................

06. උපන් දිනය : ........................................................................

07. ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................................

08. බර වාහන රියදුරු බලපත්‍රය නිකුත් කළ දිනය : ........................................................................

09. අධ්‍යාපන සුදුසුකම් : ........................................................................

........................................................................

අ.පො.ස. (සා/පෙළ) විභාගය - වර්ෂය :

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

අ.පො.ස. (උසස්/පෙළ) විභාගය - වර්ෂය :

........................................................................

........................................................................

........................................................................

10. වෘත්තීය සුදුසුකම් : ........................................................................

11. පළපුරුද්ද : ........................................................................

මා විසින් සඳහන් කරන ලද උක්ත තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර නොමැති බවටත් මෙයින් සහතික කරමි.

දිනය : 202....................

........................................................

අයදුම්කරුගේ අත්සන.

CS CamScanner